# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2024 අංක 16 දරන
# එකතු කළ අගය මත බදු
# (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2024 මාර්තු මස 20 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2024 මාර්තු මස 22 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**
**ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 12.00 තැපැල් ගාස්තුව **:** රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2024 අංක 16 දරන**
**එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2024 මාර්තු මස 20 වන දින]

එල්.ඩී.-ඕ. 74/2023

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2024 අංක 16 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (v) වන අනුඡේදය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ:- 2002 අංක 14 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) (vii) වන අයිතමයේ "සියයට දොළහක අනුප්‍රමාණය මත (එහි බදු ඛණ්ඩය 3/28 ක් වේ); සහ" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "සියයට දොළහක අනුප්‍රමාණය මත (එහි බදු ඛණ්ඩය 3/28 ක් වේ);" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) (viii) වන අයිතමයේ "2022 ඔක්තෝබර් මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා සියයට පහළොවක අනුප්‍රමාණය මත (එහි බදු ඛණ්ඩය 3/23 ක් වේ)." යන වචන සහ ඉලක්කම් වෙනුවට, "2022 ඔක්තෝබර් මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන එහෙත් 2023 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා සියයට පහළොවක අනුප්‍රමාණය මත (එහි බදු ඛණ්ඩය 3/23 ක් වේ); සහ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(3) (viii) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන්:-

"(ix) 2024 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා සියයට දහ අටක අනුප්‍රමාණය මත (එහි බදු ඛණ්ඩය 9/59 ක් වේ).".

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය, එහි (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) (vii) වන ඡේදයේ "(vii) 2022 ඔක්තෝබර් මස 1 වන දින හෝ එදිනට පසු" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "(vii) 2022 ඔක්තෝබර් මස 1 වන දින හෝ එදිනට පසු එහෙත් 2023 දෙසැම්බර් මස 31 වන දින හෝ එදිනට පෙර" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) (vii) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන්:-

"(viii) 2024 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු ශ්‍රී ලංකාව තුළ යම් බදු අයකළ හැකි ක්‍රියාකාරකමක් කරන හෝ කරගෙන යනු ලබන සෑම තැනැත්තකුම-

(අ) යම් බදු අයකළ හැකි කාලසීමාවක් අවසානයේ දී එම තැනැත්තාගේ එම බදු අයකළ හැකි කාලසීමාව තුළ දී, ශ්‍රී ලංකාව තුළ භාණ්ඩ හෝ සේවා හෝ භාණ්ඩ සහ සේවාවල බදු අයකළ හැකි සැපයුම්වල සමස්ත වටිනාකම රුපියල් මිලියන පහළොවක් ඉක්මවා ඇත්නම්; හෝ

(ආ) එවකට අවසන් වන මාස දොළහක කාලසීමාව තුළ දී, ශ්‍රී ලංකාව තුළ එම තැනැත්තාගේ භාණ්ඩ හෝ සේවා හෝ භාණ්ඩ සහ සේවාවල බදු අයකළ හැකි සැපයුම්වල සමස්ත වටිනාකම රුපියල් මිලියන හැටක් ඉක්මවා ඇත්නම්; හෝ

(ඇ) ඕනෑම අවස්ථාවක දී ඉදිරියේ දී එළඹෙන බදු අයකළ හැකි කාලසීමාව තුළ දී, ශ්‍රී ලංකාව තුළ එම තැනැත්තාගේ භාණ්ඩ හෝ සේවා සහ භාණ්ඩ සහ සේවාවල බදු අයකළ හැකි සැපයුම්වල සමස්ත වටිනාකම රුපියල් මිලියන පහළොවක් ඉක්මවීමට ඉඩ ඇති බවට හෝ ඉදිරියේ දී එළඹෙන මාස දොළහක කාලසීමාව තුළ දී රුපියල් මිලියන හැටක් ඉක්මවීමට ඉඩ ඇති බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇත්නම්,

එම තැනැත්තා මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබීමට යටත් විය යුතු ය;

(3) ඒ උපවගන්තියේ තුන්වන අතුරු විධානයේ "පැන නැගිය යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"පැන නැගිය යුතු ය:

එසේම තවදුරටත්, (viii) වන ඡේදයේ කාර්ය සඳහා, ලියාපදිංචි කිරීමේ අවශ්‍යතාවය මේ (සංශෝධන) පනත ක්‍රියාත්මක වන දින සිට බලපැවැත්වෙන පරිදි පැන නැගිය යුතු ය.".

**4.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.